වර්තමාන සමාජයේ කාර්ය බහුල, කෘත්‍රිම ජීවිත ගෙවන, යන්ත්‍ර බඳු අපේ දරු පරපුර කෙරෙහි තම චිත්ත සන්තානයේ හටගත් අනුවේදනීය හැඟීම් සමුදායක් මෙලෙසින් රසවත් කවි පෙළකට නංවා ඇති අයුරු අපූරුය.

තරුණ සිතක් තුළ හටගන්නා ආදරය, ප්‍රේමය ස්වාභාවික හැඟීම්ය. ඒවා නිසි කලට නිසි ලෙසට ක්‍රියාවට නැංවීමට සමත් වන මෙන්ම අසමත් වන්නා වූ ද තරුණ තරුණියෝ කොතරම් නම් අද සමාජය තුළ දක්නට ලැබෙද්ද! එවන් චිත්ත ස්වභාවයක්, එනම් තරුණයකු තුළ සුන්දර තරුණියක කෙරෙහි ඇති වන ඇල්ම, ආදරය, ප්‍රේමය සමාධි රාජපක්ෂ විසින් 'ඇය' නම් කවි පෙළෙන් ප්‍රතිනිර්මාණය කර ඇත්තේ මෙලෙසිනි. 'ඇය' නමින් නම් කරන මෙම කවි පෙළ මගින් කතුවරයාගේ භාෂා කුසලතාව ද පිළිබිඹු කරයි.

"දිලෙන නෙතු යුග අහංකාරය
දෙතොල නාදලු සේම සොබනය
ගගන දෙව්ලිය නොසම වේමය
මසිත බැඳුණෝ කුමට නොදනිය

සැලෙන දිගු වරලස දිලෙන්නේ
දෙතන රන තිසරුන් මවන්නේ
ගමන නාලිය ඔතප් බින්දේ
අඟන මා මනදොළ සුසින්දේ

ලෙළෙන බෝපත් කරන සද්දේ
සලන සිත සන්සුන් කරන්නේ
සසර නිම කඩඉම දකින්නට
ඇය නොවෙද කමටහන වන්නේ"

කතුවරයා වෙත ස්වභාවයෙන්ම පිහිටි ධාර්මික බව, සිල්වත් හා ගුණවත් බව සමග කිසියම් ආකාරයක ආගමික හැඟීම් ද මුසු කරමින් තම ප්‍රේමණීය සිතුවිලිවලින් සරසා 'ඇය' නම් වූ උක්ත කවි පෙළ රචනා කිරීමට යොමු වී ඇති බව පැහැදිලිය. "සැලෙන දිගු වරලස දිලෙන්නේ . දෙතන රන තිසරුන් මවන්නේ" වැනි පද යෙදීජනයන්ගෙන් කතෘවරයා එම කාන්තාවගේ සුන්දරත්වය සමග තම හැඟීම් මතු කර ලන ආකාරය ද මැනවින් දක්වා ඇත. සාම්ප්‍රදායික උපමා යොදා ගැනුණද ඒවා කිසියම් නවතාවකින් යුතුව ගළපාගන්නට ඔහු සමත් වී තිබීම වැදගත්ය. ආදරය, ප්‍රේමය බඳු හැඟීම් සමගම තම ආගමික සිතුවිලි මගින් ඒවා යම් තරමක් දුරට සතපවා ගැනීමට ද කවියා යොදා ඇති, "ලෙළෙන බෝපත් කරන සද්දේ . සලන සිත සන්සුන් කරන්නේ" යන පද පෙළ සැබවින්ම යෝග්‍යය.

බොහෝ නිර්මාණ කරුවන් සිය නිර්මාණ සඳහා උපයෝගී කරගන්නා තේමාවන් අතර 'අම්මා' ප්‍රධානත්වය දරන බවට සිංහල කවිය හා ගීතය පෝෂණය කළ ශ්‍රේෂ්ඨ නිර්මාණ කරුවන්ගේ කෘති සාක්ෂි දරයි. නිදසුනක් ලෙස ගත හොත්, මහගම සේකර කවියා අතින් නිමවුණ 'අම්මා' නමැති කවි පෙළ ඇරඹෙන ආකාරය දැක්විය හැකිය.

"ඔබා දෙදණ නිල් උඳුපියලිය බිම මත
වැන්දේය ඔහු බැති සිතින්
අම්මා වැළලූ තැන මහ පොළොවට,
පිපිලා තිබුණි එතැන සුදු පාටට
නමක් නොමැති පුංචි මලක්
සිම්බේය ඔහු එමල නමා හිස
දස මසක් කුස තැළෙහි දරා සිට
මා ලොවට වැදූ අම්මා ඔබය
කෙළවරක් නොමැති දුක් දරා විඳ
මා ලොවට හැදූ අම්මා ඔබය...."

තමන් මෙලොවට බිහි කර, හදා වඩාගත් අම්මා වැළලූ තැන සිට වැළපෙන අහිංසක හදවතක් පිළිබඳ කාව්‍යමය චිත්‍රයක් මෙම කොටසෙන් ප්‍රතීයමාන වෙයි. සමාධි රාජපක්ෂ ද තම 'තුවරලා' කාව්‍ය කෘතියට 'අම්මා' නමින් කවිපෙළක් එක් කිරීමේ අවශ්‍යතාව අවබෝධ කරගෙන තිබීම පුදුමයක් නොවේ. සිවුපද විරිතෙන් ලියවුණ කවි දෙකකින් සමන්විත මෙම නිර්මාණය රසික හදවත් තුළ සංවේදී හැඟීම් ජනිත කරවන බව අමුතුවෙන් කිව යුතු නැත.

"සුදු පාටට හිම කැට කැට
ගස්වැල්වල ඇම්ණෙන කොට
සීත සුළං දැවටි දැවටි
ඒ හා දොඩමළු වෙනකොට
සතර වටින් උහුලන්නට
බැරි සීතල ගොඩ වෙනකොට
අම්මේ උකුලේ නුඹගේ
උණුසුම දැනුණා හනිකට

කොළ හැලිච්ච අතු අතරින්
මළහිරු එබිකම් කරද්දි
ගුවන්තලේ තනි වුණ පොඩි
තරු කැට මට අත වනද්දී
බුදුන් පුදා හැමදාමත්
නුඹෙ නම සිහි කර වඳිද්දී
සිහිනෙන් වත් නුඹෙ වත මට
දකින්න ඇත්නම් හිතිච්චි"

අම්මා පිළිබඳ තම සිතුවිලි වෙනත් ඇතැම් කවියන් පළනොකළ ආකාරයෙන්, කිසියම් විශේෂත්වයකින් යුතුව කවියට නැගීමට සමාධි රාජපක්ෂ සමත් වී ඇති බවට උක්ත පැදි දෙක නිදසුන් සපයයි. ගුණදාස කපුගේ ගායකයා විසින් ගයෙන මව පිළිබඳ ගීතයෙන් හැඟවෙන මවකගේ ගුණ මහිමය මෙම කවි පෙළෙන් ද යම් තරමක් දුරට හෝ මතු වී පෙනෙයි. මහ වැසි වට රාත්‍රියේ තමන් තුරුළු කරගෙන වැස්සෙන් නොතෙමී බේරාගන්නට සිය මව දැරූ වෑයම ගුණදාස කපුගේ ගායකයාණන්ගේ සංවේදී හඬින් ඇසෙන විට දැනෙන සිත් වේදනාව සමාධි රාජපක්ෂගේ පද පෙළින් ද යම් තරමක් දුරට හෝ දැනෙන අයුරු පාඨකයාට පසක් වනු ඇත. "සතර වටින් උහුලන්නට බැරි සීතල ගොඩ වෙන කොට . අම්මේ උකුලේ නුඹගේ උණුසුම දැනුණා හනිකට". කවියන් හා ගීත රචකයන් සිය අත්දැකීම් හෝ වෙනත් අය මුහුණ දුන් සිදුවීම් මගින් ලද අත්දැකීම් හෝ මගින් තම දයාබර මෑණියන් පිළිබඳව හැඟීම් ප්‍රකට කරවද්දී රසික මනසට ද එය නොඅඳුව දැනෙයි. ධර්මසිරි ගමගේ මහතා අතින් රචනා වී විශාරද නන්දා මාලනී විසින් ගයෙන "අම්මාවරුනේ, අම්මාවරුනේ, සම්මා සම්බුදු අම්මාවරුනේ ...." නම් වූ මිහිරි ගීතය විශ්වවිද්‍යාල ශිෂ්‍ය පිරිසක් සඳහා පැවැත්වූ දේශනයකදී නිදසුනක් ලෙස ඉදිරිපත් කළ මොහොතේදී මුළු දේශන ශාලාව පුරාම අසුන් ගෙන සිටි හැම ශිෂ්‍යශිෂ්‍යාවක්ම කඳුළු සැලූ අවස්ථාවක් මගේ මතකයට ද නැගෙයි. ඒ අනුව බලන විට සංවේදී මාතෘකාවක් වන 'අම්මා' යන්න සමාධි රාජපක්ෂගේ පෑන් තුඩින් ද මනහර ලෙස ලියවී තිබෙන අයුරු 'අම්මා' යන මැයෙන් රචිත පැදි දෙකෙන් ද ප්‍රතීයමාන වෙයි.

මාලිනී ජයරත්න තමන් පවුල තුළ අවබෝධ කරගත් වැදගත් සිතුවිල්ලක්, "අම්මා සඳකි ..." යන අගනා ගීතයකට හරවා ටී. එම්. ජයරත්න ගායකයාණන් එය ගයද්දී මව්ගුණ පමණක් නොව පියගුණ ද අප සිත් තුළ නොමැකී ඇති බව සාක්ෂාත් කරයි. වෛද්‍ය සමාධි රාජපක්ෂ අතින් ලියවුණ 'අප්පච්චි' නම් කවි පෙළ ද මෙලොව එළිය දකින කවර පුද්ගලයකුට හෝ මවගේ මෙන්ම පියාගේ ද වටිනාකම කොතරම් දැනිය යුතුද යන්න ප්‍රකට කරවයි. තමන් යෙදී සිටින වෛද්‍ය වෘත්තියේදී තමන්ට හමු වූ අසරණ රෝගී පියෙක් මිය යාමේ පුවත විෂය කරගනිමින් සමාධි අතින් ලියවුණ මෙම කවිපෙළ ද, සුනිල් එදිරිසිංහ ගායකයාණන්ගේ මිහිරි හඬින්, සංගීතවේදී නවරත්න ගමගේ විසින් යොදන ලද මිහිරි සංගීතයෙන් ඔපවත්ව ගයන්නට ද හැකි වී ඇති අගනා නිර්මාණයකි.

"වැවේ වතුර ඉවුරු තලා දෝරෙ ගියාදෝ
වනේ සුපිපි වනමල් පෙති ඉහිර ගියාදෝ
සෙනේ නුඹේ ඉහ ඉද්දර මැකී ගියාදෝ
අනේ අපේ අප්පච්චි නිවන් ගියාදෝ

දෑතේ කරගැට තවමත් ඉතිරි වෙලාදෝ
පෑ අඬහැර උඩු සුළඟේ පාව ගියාදෝ
නුඹේ සෙනෙහස කවදාවත් ආයෙ ලැබේදෝ
අනේ අපේ අප්පච්චි නිවන් ගියාදෝ

රෑ කළුවර බෝ වෙනවා පහන නිවුනිදෝ
දිවි මං හිරු පායනවා විරිය සිඳුනිදෝ
සෑ පුදු බිම සිහි වෙනවා මළුව පාළුදෝ
අනේ අපේ අප්පච්චි නිවන් ගියාදෝ"

දක්ෂ කවියකු හෝ අන් කවර ලේඛකයකු හෝ තම නිර්මාණ කෘතියකින් සිය ජීවන අත්දැකීම් සුන්දර ලෙස මතු කරලන බොහෝ අවස්ථා අපට හමු වෙයි. සමාධි රාජපක්ෂ 'තුවරලා' කාව්‍ය කෘතියට එක් කරගෙන ඇත්තේ ද එවැනි සංවේදී අත්දැකීමය. යහපත් පවුල් ජීවිතයක් සඳහා යහපත් පතිනියක් තමන්ට හමු වී ඇති අයුරු අවසානයට දක්වමින් මෙම කෘතිය නිමවා ඇත්තේ මෙසේය.

කෝඩුකාර හිතට හොරෙන්
නිසොල්මනේ එබී බලා
මෝදු වෙන්න හනික සඳට
කිරි කෝඩේ තුරුල් කළා
කෝලවදන් සෙනෙහස පා
සිත දවටා දෝරෙ ගලා
පෑයු සරා සඳවතිදෝ
මගේ ලොවට නිසංසලා

IMMIGRATION LAW @
Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

Professional Immigration Legal Services
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas



A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents



Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory
Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com



We Deliver Results...